# ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

# පුරප්පාඩු

ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## කළමනාකරණ සහකාර - තාක්ෂණ බණ්ඩය 2 (MA - 2- 1 -2016)

**අධ්‍යාපන සුදුසුකම් - (බාහිර අයදුම්කරුවන්)**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී, සිංහල/දෙමළ ඉංග්‍රීසි භාෂාව, ගණිතය ඇතුලුව විෂයන් 04 කට සම්මාන සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී, විද්‍යා හෝ ගණිත විෂය ධාරාවෙන් සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

**තාක්ෂණික නිපුණතා/ ප්‍රවීණතා**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතා (N.V.Q) පහ (05) මට්ටමට අඩු නොවන්නා වූ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

**විශේෂ සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් යාන්ත්‍රික ඉංජිනේරු ඩිප්ලෝමාවක් හෝ ඊට සමාන සුදුසුකම් සහ වසර 01 ක රජයේ පිළිගත් වාණිජ ආයතනයක නිෂ්පාදන හෝ ඉංජිනේරු අංශයේ පළපුරුද්ද

**ආරම්භක වැටුප් පරිමාණය :-**

2016.01.01 දින සිට MA2-1 – 2016 – රු 30,310 /= මීට අමතරව රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ.

## විදුලි කාර්මික- කර්මාන්ත (Electrician Industrial) ( PL - 3)

**(අ) අධ්‍යාපන සුදුසුකම් (බාහිර අයදුම්කරුවන්)**

**අධ්‍යාපන**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (විද්‍යාව, ගණිතය ඉංග්‍රීසි යන විෂයයන් ඊට ඇතුලත් වීම විශේෂ සුදුසුකමකි.)

**(ආ) ශිල්පීය නිපුණතා**

තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) සිව්වැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් සමග වසර 2 කට නොඅඩු කර්මාන්තශාලා විදුලි කාර්මික සේවා පළපුරුද්ද ලබා තිබීම.

- තෙකලා විදුලි සැපයුම පිළිබඳ දැන සිටීම, විදුලි මෝටර් සහ සැපයුම් පිළිබඳ දැන සිටීම (ස්ටාර් / ඩෙල්ටා) PLC දැනුම සහ ඉලෙක්ට්‍රොනික් පිළිබඳ දැන සිටීම විශේෂ සුදුසුකමක් වනු ඇත.

**ආරම්භක වැටුප් පරිමාණය :-**

2016.01.01 දින සිට PL 3 –2016 – Grade 111 රු. 26,290 /= මීට අමතරව රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ.

## බොයිලේරුකරු (Boilerman) - ( PL– 2)

**(අ) අධ්‍යාපන සුදුසුකම් - (බාහිර අයදුම්කරුවන්)**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. සහ

**(ආ) ශිල්පීය නිපුණතා / ප්‍රවීණතා**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) දෙවෙනි හෝ තුන්වැනි මට්ටමට ගැළපෙන පරිදි (Steam Boiler Operation සම්බන්ධව ) ඉහත තනතුර සඳහා වූ ශිල්පීය නිපුණතා / ප්‍රවීණතා සහතිකය සමග වසර 3 කට නොඅඩු පුහුණුව / පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**විශේෂ සුදුසුකම්**

- බොයිලේරු ක්‍රියාකරු බලපත්‍රය (Class 3 ) අවම සුදුසුකම් සේ සැලකේ.
- වසර 01 කට නොඅඩු වාෂ්ප බොයිලේරු පළපුරුද්ද

## වෑද්දුම්කරු (Fitter) – ( PL - 2)

**(අ) අධ්‍යාපන සුදුසුකම් (බාහිර අයදුම්කරුවන්)**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. සහ

**(ආ) ශිල්පීය නිපුණතා / ප්‍රවීණතා**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (N.V.Q) දෙවෙනි හෝ තුන්වැනි මට්ටමට ගැළපෙන පරිදි ඉහත තනතුර සඳහා වූ ශිල්පීය නිපුණතා/ ප්‍රවීණතා සහතිකය සමග වසර 2 කට නොඅඩු කර්මාන්ත අංශයේ පුහුණුව/ පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**පොදු**

**ආරම්භක වැටුප් පරිමාණය :-** 2016.01.01.දින සිට PL2 - 2016 –Grade 111 රු. 25,750 /= මීට අමතරව රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ.

**වයස :-** වයස අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි අය විය යුතුය.

**වෙනත් :-** සෑම අයදුම්කරුවෙකුම

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iv. සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය 10%ක් දැරිය යුතු අතර, සමාගම විසින් ඒ සඳහා 15%ක් දරනු ලැබේ. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට 3% ක දායකත්වයක් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම මගින් දරනු ලැබේ.

v. වයස අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩ අය විය යුතුය.

vi. රාත්‍රී වැඩමුර ක්‍රියාත්මක වේ.

අයදුම්පත් තමා විසින් නිම සකස් කොට සියලු තොරතුරු හා සුදුසුකම් ඇතුළත් කර කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුරේ නම පැහැදිලිව සඳහන් කර අදාළ අයදුම්පත් 2024.11.28 වන දිනට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**ලිපිනය :** ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මානව සම්පත් හා නීති) ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්,
තැ.පෙ. 17, කපුවත්ත, ජා–ඇළ.